**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2022**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය**

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ (කමිටුව) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පනවා තිබූ 1993 ජුනි 29 දිනැති අංක 773/7 දරන රෙගුලාසි. | | | |
| | (i) 2(අ) වගන්තිය | කොංග්‍රසය, කමිටු, සම්මන්ත්‍රණ හෝ වෙනත් රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද කරුණු ඇතුළුව ක්‍රීඩා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට අභිනියෝජිතයාගෙන් හෝ අභිනියෝජිතයන්ගෙන් වාර්තා ලබා ගැනීමට කමිටුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි අමාත්‍යවරයාට සහ අමාත්‍යාංශ ලේකම්වරයාට වාර්තා ලබාදීමට අපි එකඟ වී ඇත. | නියම කර ඇති නීති රීති පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 7 වගන්තිය | එම රැස්වීමෙන් දින 30ක් ඇතුළත වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තා වාර්ෂික වාර්තාව සමඟින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ක්‍රීඩා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට කමිටුව කටයුතු කර නොතිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ක්‍රීඩා වෙත වාර්තාව ඉදිරිපත් කිරීමට අමතරව, නීති රීතිවලට අනුකූලව වාර්ෂික වාර්තාව අමාත්‍යවරයා සහ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දීමට අපි එකඟ වී ඇත. | |
| | (iv) 8 (අ) සහ (ආ) වගන්තිය | ඔලිම්පික් කමිටුවට දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ලැබුණු සියලුම මුදල්, උපකරණ සහ අනෙකුත් සම්පත් සහ සියලුම මුදල් උපකරණ පිළිබඳ කාර්තුමය වාර්තා සහ ඔලිම්පික් කමිටුව විසින් එක් එක් කාර්තුව තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කාර්තුමය ප්‍රගති වාර්තා ක්‍රීඩා ඇමැතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.. | 2024 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ත්‍රෛමාසික වාර්තා අමාත්‍යවරයාට සහ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ලබාදීමට අපි එකඟ වී ඇත. | නියම කර ඇති නීති රීති පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 19 සහ 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද 1976 නොවැම්බර් 30 දිනැති අංක 211/03 දරන රෙගුලාසියේ 2 (අ), (ආ) සහ (ඇ) වගන්තිය. | පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වී සිටින ඔලිම්පික් කමිටුව විසින් නම් කරන ලද නිලධාරීන් 06 දෙනෙකු සඳහා එම කමිටුව ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තව දුරටත් ඔවුන්ගෙන් 02 කු නැවත ශ්‍රී ලංකාවට පැමිණ නොතිබුණි. | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා සහභාගිවන්නන්ගේ සම්පූර්ණ ලැයිස්තුවම අපි අමාත්‍යාංශයට ඉදිරිපත් කරනවා. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල රු. 59,349,292 ක අතිරික්තයක් වූ අතර පෙර වසරේ අනුරූප අතිරික්තය රු. 14, 920,228 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලවල රු. 44,429,064ක වර්ධනයක් නිරීක්ෂණය විය. ජාත්‍යන්තර සංවිධානවල සහනාධාර, පොලී ආදායම සහ ව්‍යාපෘති ආදායම පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් රු. 33,802,724, රු. 8,372,112 සහ රු. 117,914,660 කින් ඉහළ යාම මෙම දියුණුවට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ආවරණය කිරීම සඳහා මාධ්‍යවේදීන් 03 දෙනෙකු විනිවිද භාවයකින් තොරව ඔලිම්පික් කමිටු සභාපතිවරයාගේ සහ ලේකම්වරයාගේ උපදෙස් අනුව තෝරාගෙන එම අනුග්‍රහය දැක්වීමට හේතු සාධාරණීකරණය කරමින් ජාතික ඔලිම්පික් කමිටුව විසින් ඔවුන්ගේ ගුවන් ටිකට්පත්වල මුළු පිරිවැය සඳහා රු. 1,975,800 ක් සහ දෛනික මුළු දීමනා රු. 1,227,714. ක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත ඔවුන්ගේ මූල්‍ය ආධාර ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, අපි EXCO අනුමැතිය ඇතිව ඔවුන්ගේ ආහාර වේල සඳහා ප්‍රවේශපත්‍ර සංවිධානය කර දෛනික දීමනා ආවරණය කළෙමු. කෙසේ වෙතත් එකහ වූ පරිදි සහභාගිවන්නන් සඳහා අරමුදල් විධිවිධාන සඳහා චක්‍රලේඛය විධිමත් කරන්නෙමු. | විනිවිද පෙනෙන මාධ්‍ය අනුග්‍රහක ප්‍රතිපත්තියක් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ආ) | ජාතික ඔලිම්පික් කමිටු ව්‍යවස්ථාවේ 04 වැනි වගන්තියේ 3(ආ) වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුළ පොදුවේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම, පහසුකම් සැලසීම සහ සංවර්ධනය කිරීම එක් අරමුණකි. ජාතික ඔලිම්පික් කමිටුවේ සම්මේලන 32ක් ලියාපදිංචි වී තිබුණද, ජාතික ඔලිම්පික් කමිටුවේ සහයෝගීතාවයෙන් ඒ ඒ ක්‍රීඩාව සඳහා දිගුකාලීන සංවර්ධන සැලැස්මක් කමිටුව විසින් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘති සංවර්ධනය පිළිබඳ අපගේ උපායමාර්ගික සැලැස්ම තුළ අපි සෑම සම්මේලනයක් සඳහාම සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු. අපි සම්මේලනය සමඟ තවදුරටත් සාකච්ඡා කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන්නෙමු. | එක් එක් ක්‍රීඩාව සඳහා දිගුකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රීඩා සංගම් 29 න් 17 කට අදාළව වෙන් කරන ලද රු.3,400,000 වාර්ෂික පරිපාලන දීමනාව පියවීමට ජාතික ඔලිම්පික් කමිටුව විසින් කටයුතු කර නොතිබුණි, සහ අනෙකුත් ව්‍යාපෘති ආශ්‍රිත ගෙවීම් සහ පෙර වර්ෂයේ වාර්ෂික පරිපාලන ප්‍රදානය රු. සමාලෝචිත වර්ෂය තුළ 3,174,651 ක් විය. | කමිටුව විසින් අනුමත කරන ලද ක්‍රියා පටිපාටිය වන්නේ යම් යම් අවශ්‍යතාවලට අනුකූල වීම සහ ඔවුන්ගේ වාර්ෂික ප්‍රදාන සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් සඳහා අයදුම් කිරීමයි. අවශ්‍යතා සපුරාලීමට සහ අපගේ වගකීම් ඉටු කිරීමට මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අපි ජාතික ෆෙඩරේෂන් අඛණ්ඩව යොමු කරන්නෙමු. | වෙන් කරන ලද වාර්ෂික පරිපාලන ප්‍රදාන සහ වර්ෂය සඳහා ලබා දී ඇති ව්‍යාපෘති ආශ්‍රිත වියදම් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සහභාගි වූ නිලධාරීන්ට දින 04කට පමණක් නවාතැන් වෙන් කරන ලෙස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා කළ ඉල්ලීම සැලකිල්ලට නොගෙන රු. 2,139,548 ට සමාන පවුම් 4,456 මුදලක් දින 14 සඳහා නවාතැන් පහසුකම් ලෙස ගෙවීම් කර තිබුණි. මෙම අවස්ථාව සඳහා ඉහත නිලධාරීන් සහභාගි වී නොතිබුණද එසේ ගෙවන ලද මුදල් එම නිලධාරීන්ගෙන් අය කර ගෙන නොතිබූ අතර එක් පුද්ගලයකු ගෙන් රු. 567,600ක් පමණක් අය කරගෙන තිබුණි. | නවාතැන් වෙන්කරවා ගැනීමේ සම්මත ක්‍රියා පටිපාටිය වන්නේ නියමිත දිනට හරියටම වසරකට පෙර ඔවුන්ගේ පද්ධතිය හරහා සිදු කිරීමයි. අමාත්‍යාංශය සහභාගී වන දින නියමිත වේලාවට දැනුම් නොදුන් අතර තවදුරටත් අපි සහභාගිවන්නන් චක්‍රීය පදනමින් කාමරවලට වෙන් කිරීම සිදු කරන්නෙමු. | වෙන්කරවා ගැනීමට පෙර, සහභාගිවන්නන්ගේ සැබෑ සංඛ්‍යාව සහ රැඳී සිටීමට අවශ්‍ය දින ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කමිටුවට බඳවා ගැනීම සහ උසස්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර නොතිබුණි. | තනතුරු අනුව සුදුසුකම් ඇතුළත් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සහ උසස්වීම් සඳහා වන නිර්ණායක ගෙනහැර දැක්වීමට සහ උසස්වීම් සඳහා පදනම ස්ථාපිත කිරීමට අපි එකඟ වුණෙමු. | ඵලදායී මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. |

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 ආයතනික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කමිටුව විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම වසර 10ක් සඳහා කෙටුම්පත් කර ඇති අතර සෑම වසරකම සංශෝධනය කරන්නෙමු. සංයුක්ත සැලැස්ම අමාත්‍යාංශය මගින් අනුමත කල පසු පිටපත් විගණකාධිපති වෙත ලබාදීමට කටයුතු අරනු ලැබේ. | කෙටුම්පත සම්පූර්ණ කිරීමට සහ සංයුක්ත සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |